නිපුණතා මට්ටම - 16.5 - සේවකයන් ආකර්ෂණය කර ගැනීම සඳහා රැකියා දැන්වීම් පිළියෙළ කරයි.

සංවිධානයක අරමුණු ඉටු කර ගැනීමට හැකිවන දැනුම,කුසලතා,ආකල්පවලින් යුත් රැකියා අපේක්ෂකයින් ආයතනය වෙත ඇද ගැනීම සඳහා ආයතනයක් ගන්නා ක්‍රියාමාර්ග ආකර්ශනය ලෙස හැඳින්වේ.මෙම කාර්ය මානව සම්පත් සැලසුම්කරණය,රැකියා විග්‍රහය,තෝරා ගැනීම,ගෙවීම් කළමනාකරණය වැනි කාර්යයන්ට සෘජුව සම්බන්ධ වේ.

<u>සේවක ආකර්ශනයේ පියවර</u>

1.රැකියා ඇබෑර්තු හඳුනා ගැනීම
2.රැකියා නියමයන් අධ්‍යයනය කිරීම.
3.සංවිධාන ප්‍රතිපත්ති,පිරිවැය,කාලය වැනි සාධක සලකා බැලීම.
4.අයදුම්පත පිළියෙල කිරීම.
5.ආකර්ශන ක්‍රමය තෝරා ගැනීම.
6.පුරප්පාඩු ප්‍රසිද්ධ කිරීම හා අයදුම්පත් කැඳවීම.
7.අයදුම්පත් ඇගයීම.

ආයතනයකට ආකර්ශනය කළ හැකි ප්‍රධාන ක්‍රම 2කි.

1.<u>අභ්‍යන්තරින් සිදු කරන ආකර්ශනය</u>

උදා- රැකියා දැන්වීම්,කුසලතා ලේඛන,අභ්‍යන්තර සේවකයින්ගේ හඳුන්වාදීම්

2.<u>සංවිධානයට බාහිරින් කෙරෙන ආකර්ශනය</u>

උදා - පුවත්පත්,රූපවාහිනී මගින් කෙරෙන ප්‍රචාරණය

රැකියා නියෝජිත ආයතන මගින්

රැකියා වෙබ් අඩවි මගින්

ගැසට් නිවේදන

<u>ඇගයීම 1</u>

1.සංවිධානයකට අභ්‍යන්තරින් සිදු කරන ආකර්ශනය නිසා ඇතිවන වාසි අවාසි 4 බැගින් සඳහන් කරන්න.

2.ආයතනයකට වඩා වාසිදායක වන්නේ කුමන ආකර්ෂණ ක්‍රමයද?ඇගයීමට ලක් කරන්න.